www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුරෝපා සංගමයේ ව්‍යවස්ථාව පිලිබඳ ස්පාඤ්ඤ ජනමත විචාරනයේ දී "නැත" කියා ඡන්දය දෙන්න

## Vote "no" in Spanish referendum on European Union constitution

**බ්‍රිතාන්‍ය හා ජර්මානු සමාජවාදී සමානතා පක්ෂවල ප්‍රකාශය**

**2005 පෙබරවාරි 19**

පෙබරවාරි 20 වන ඉරු දින යුරෝපා සංගමයේ යෝජිත ව්‍යවස්ථාව සඳහා ජනමත විචාරනයක් පවත්වන පලමු වන රට ස්පාඤ්ඤය වේ.

එලඹෙන මාස දහ අට පුරා මෙම කරුන සම්බන්ධව රටවල් 10ක් පුරා පැවැත්වීමට නියමිත ජනමත විචාරන තුලින් ප්‍රජාතාන්ත්‍රික උපදෙස් පැතීමක පලමුවැන්න ලෙස මෙම ඡන්දය, ස්පාඤ්ඤ ආන්ඩුව සහ යුරෝපය පුරා දේශපාලන ප්‍රභූවේ වැඩි කොටස විසින් ඉදිරිපත් කරනු ලැබ ඇත. සාරය වසයෙන් ජනමත විචාරනය යනු මහාද්වීපය පුරා ආර්ථික හා සමාජ සම්බන්ධතාවන් තමන්ගේ වාසියට යලි හැඩගැස්වීමේ යුරෝපීය ධනපති පන්තියේ උත්සාහයන් නීත්‍යනුකූල කිරීමකි.

කම්කරු පන්තියේ දිනට භුක්තිවිඳින්නා වූ ප්‍රජාතන්ත්‍ර අයිතීන් ද ජීවන තත්වයන් ද විනාශ කිරීම මගින් ප්‍රධාන යුරෝපීය බලවතුන් හා අන්තර්ජාතික සංගතයන් සිය ඇමරිකානු, ජපන් සහ චීන තරගකරුවන්ට විරුද්ධව ලෝක රඟ මඬලේ තරගකාරිත්වයට පැමිනීමේ මාධ්‍යය ලෙස යුරෝපය ඒකාග්‍ර කිරීමේ ව්‍යාපෘතිය යුරෝපීය පාලක ප්‍රභූව තුල පිලිසිඳගෙන ඇත.

මෙම ප්‍රහාරය, ස්වාධීන යුරෝපීය හමුදා ශක්තිය ගොඩනැගීම කරා වූ ධනපති පන්තියේ ධාවනය සමග ඒකාබද්ධ වී ඇත. ඉරාකයේ තෙල් බිම් තම පාලනයට නතු කර ගැනීම සඳහාත් සමස්ත මැද පෙරදිග මත තම ආධිපත්‍යය තහවුරු කර ගැනීම සඳහාත් එක්සත් ජනපදය සහ එහි මිතුරු රාජ්‍ය විසින් දියේලි කොට ඇති නීති විරෝධී ආක්‍රමනකාරී යුද්ධය මගින් නිරූපනය කොට ඇති නව යටත් විජිත ක්‍රමයේ ලෝකයේ සම්පත් නැවත බෙදා ගැනීමක දී තමන්ගේ කොටස ආරක්ෂා කර ගැනීම සඳහා මංමුලා සහගත උත්සාහයක යුරෝපා බලවතුන් යෙදීගෙන ඇත.

යුරෝපා සහ ස්පාඤ්ඤ කම්කරු පන්තියට එරෙහිව ගොඩ නගමින් තිබෙන මෙම ප්‍රහාරයන් මානව සංහතිය ම්ලේච්ඡත්වයේ නව කාල පරිච්ඡේදයකට ඇද දැමීමට තර්ජනය කරන මිලිටරිවාදයේ පුපුරුයාමටත් එරෙහිව දේශපාලන විරෝධය පනගැන්වීමේ මාධ්‍යයක් ලෙස ජනමත විචාරනයේ දී ''නැත'' යනුවෙන් තම ඡන්දය ප්‍රකාශ කරන ලෙස *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* දැඩි ලෙස ඉල්ලා සිටියි.

අප මූලධර්මයක් වසයෙන් මහාද්වීප ඒකාබද්ධ කිරීම සාධනීය බවත් අවශ්‍ය බවත් පිලිගනිමු. එහෙත් මෙය ප්‍රජාතන්ත්‍රවාදී සහ සමාජමය වසයෙන් ප්‍රගතිශීලී ආකාරයකට මුදුන් පමුනුවා ගත හැක්කේ මහා ව්‍යාපාරයන්ට සහ ඒවායේ දේශපාලන නියෝජිතයන්ට විරුද්ධව අශමනීය අරගලයක යෙදීගන්නා යුරෝපීය කම්කරු පන්තියේ ස්වාධීන ක්‍රියාකාරිත්වය මගින් පමනකි. ධනවාදී පදනම් මත ඒකාබද්ධ කිරීමේ යුරෝපා ප්‍රභූවේ සැලසුම්වලට ප්‍රතිපක්ෂව කම්කරු පන්තිය තමන්ගේ ම ස්වාධීන අයිතීන් අන්තර්ගත කොට ගත් මූලෝපායක් පෙරට ගෙනයා යුතුව ඇත. සමාජවාදී රාජ්‍යයන්ගේ එක්සත් යුරෝපයක් ගොඩනැගීමේ අරගලය තුල ගොනුවී ඇත්තේ මෙම මූලෝපාය යි.

### අන්තර් අධිරාජ්‍යවාදී ඝර්ෂනයන් වැඩී යාම

ඒකාබද්ධ කිරීමේ සිය ව්‍යාපෘතිය සඳහා නව ව්‍යවස්ථාමය රාමුවක් සැකසීමේ යුරෝපීය ධනේශ්වරයේ උත්සාහයන් පෙරට ගෙන යනු ලබන්නේ නිෂ්පාදනය භූගෝලීය කරනය වීම සහ එහි ප්‍රතිඵලය ලෙස වර්ධනය වී ඇති අන්තර් අධිරාජ්‍යවාදී කාකොටාගැනීම් මගින් උග්‍ර කොට ඇති මූලික නියාමයන් මගින් ඉදිරියට තල්ලු කොට ඇත.

ගෝලීය සංස්ථාවන්ට සහ මූල්‍ය ආයතනයන්ට ජාතික දේශසීමාවන් නොතකා ලෝකයේ ඕනෑම තැනක නිෂ්පාදනය ස්ථානගත කිරීමේ හැකියාව ඇත. බොහෝ ජාතීන්ගේ දල දේශීය නිෂ්පාදනයේ වටිනාකම අඟුටුමිට්ටන් කල හැකි තත්වයක පවතින තම ආදායම් මගින් ඒවාට, ජාතික ආන්ඩුවලින් ව්‍යාපාරික බදු කපා හැරීමටත් සිය ශ්‍රම වියදම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා බලකර සිටීමේ හැකියාව ලැබී ඇත.

යුරෝපීය ධනේශ්වරය මෙම වර්ධනයට ප්‍රතිචාර දක්වා තිබෙන්නේ හැම ජාතික ආන්ඩුවක්ම සුභසාධන පිරිවැය ද බදු අයකිරීම් ද කපාහැරීම සම්බන්ධයෙන් බැංකුවලට සහ කොටස් වෙළඳපොලවලට වගකීමට බැඳී සිටින්නා වූත් ප්‍රාග්ධනයේ නිදහස් සංසරනයට ඇති සියලුම සීමාවන් ඉවත්කරන ලද්දා වූත් එක්සත් ජනපදය සමග තරගයේදී අභ්‍යන්තර වෙළඳපොලක් සහිත එක්සත් වානිජ්‍ය කන්ඩායමක් ස්ථාපනය කිරීමට උත්සාහ කිරීම මගිනි.

නමුත් එක්සත් ජනපදයට එවැනි ආර්ථික අභියෝගයක් කිරීම පමනක් ම ප්‍රමානවත් නො වේ. යුරෝපය මගින් නියෝජනය කරන ලද ආර්ථික අභියෝගය කපා හැරීම සඳහා සිය සුපිරි මිලිටරි ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් බුෂ් පරිපාලනය ඇමරිකාවේ ගෝලීය ආධිපත්‍යය ප්‍රකාශකිරීමට උත්සාහ කරමින් සිටී. මෙම සටන එල්ලවන්නේ ඉරාකය වැනි කුඩා රටවලට විරුද්ධව පමනක් නොව වොෂින්ටනයේ ආඥාදායකත්වයට යටත් විය යුතු බවට අන ලබා සිටින ඇමරිකාවේ ප්‍රධානතම අධිරාජ්‍යවාදී තරගකරුවන්ට විරුද්ධව ද වේ.

මෙය යුරෝපා බලවතුන්ට සිය සාමූහික සම්පත් ඒකරාශී කිරීමෙන් ද, පොදු ශුභ සාධන හා සේවා සම්පාදනය වෙතින් පොදු පිරිවැය බැහැර කොට මිලිටරි සහ යුධ අවි කර්මාන්තය ගොඩනැගීම පැත්තට නාටකාකාර ලෙස හැරවීමට ද බල කෙරෙන අතර මෙය අනෙක් අතට යුරෝපීය කම්කරුවන් වෙත තවතවත් දැඩි ප්‍රහාරයන් එල්ලකිරීම අවශ්‍ය කරවයි.

සියලු සමාජ ආරක්ෂාවන්ගෙන් තොරවූ විශාල ලාභ ශ්‍රම සම්පාදනයක කොන්දේසි නිර්මානය කිරීම සඳහා යුරෝපා හවුලේ අභ්‍යන්තර වෙළඳපල තුල කම්කරු පන්තිය සූරාකෑමට තිබුනු සියලු සීමා බන්ධනයන් ඉවත් කරනු ලැබේ.

මහාද්වීපය පුරා දේශපාලන ජීවිතය පාලනය කරමින් සිටින මහා පරිමාන සංස්ථාවන් ද, මූල්‍ය කතිපයාධිකාරයන් ද, මත දැරිය නොහැකි බරක් පැටවීමට හේතු වී ඇතැයි සැලකීමේ පදනම මත ශිෂ්ඨ සම්පන්නව ජීවත් වීමට ප්‍රමානවත් වේතනයක් ද විශ්‍රාම වැටුපක් ද ලැබීමට හා සෞඛ්‍ය පහසුකම් සඳහා ඇති අයිතීන් කීතු කර දමා ඇත.

## අත්ලාන්තික් සාගරබද සබඳතාවන්ගේ බිඳවැටීම

ආර්ථික භූගෝලීය කරනය මගින් ගිනි අවුලුවා ඇති ජාත්‍යන්තර දේශපාලන සහ සමාජ සබඳතාවන්ගේ වෙනස් වීම් ස්පාඤ්ඤ දේශපාලනය කෙරෙහි ප්‍රගාඪ බලපෑමක් ඇති කර තිබේ. ජෝස් මාරි අස්නාර්ගේ මහජන පක්ෂ (පීපී) ආන්ඩුව ඉරාකයට එරෙහි නීති විරෝධී යුද්ධයේ දී බුෂ් පරිපාලනයේ ප්‍රධාන මිතුරෙක් බවට පත් වූ අතර ස්පාඤ්ඤ විදේශ ප්‍රතිපත්තිය ඇමරිකාව දෙසට තීරනාත්මකව නැඹුරු කරන්නා වූ දිශානතියක් යලි මුල් බැස්සවීමට උත්සාහ කරයි.

2003 වසරේ යුද්ධයට විරුද්ධව දස ලක්ෂ ගනනින් වීදි බට ස්පාඤ්ඤ ජනතාවගේ පුලුල් විරෝධය මෙය වෙත එල්ල වී තිබේ. 2004 මාර්තු 11 වන දින ඉස්ලාමීය බලවේගයන් විසින් සිදු කල ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාරයන් ද ඒවා සිය මැතිවරන කටයුතු සඳහා යොදාගැනීමට අස්නාර් ආන්ඩුව විසින් ගන්නා ලද නරුම උත්සාහයන් ද විසින් අවුලවා ලන ලද මහජන ව්‍යාපාරයක් මගින් මහජන පක්ෂයේ (පීපී) ආන්ඩුව පරාජයට හෙලමින් ජොසේ සැපටීරෝගේ නායකත්වයෙන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පීඑස්ඕඊ ය බලයට ගෙන ආවේ ය.

එහෙත් සිදුවීම්වලින් සිදු කරන ලද්දේ පීඑස්ඕඊ යේ වෙනත් යුරෝපීය ආන්ඩුවක් එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට බැරෑරුම් ලෙස විරුද්ධ වීමේ හැකියාවකින් හෝ අභිලාෂයකින් සිටිතියි යන මිථ්‍යාවන් කම්කරු පන්තිය නිරායුධ කිරීමට ම පමනක් සේවය කරන බව යි. ප්‍රන්සය හා ජර්මනිය මෙන් ම ස්පාඤ්ඤය ද එක්සත් ජනපදයට විරෝධය දක්වන්නේ ඇමරිකාවේ භූගෝලීය ආධිපත්‍යය තමන්ගේ ම අධිරාජ්‍යවාදී අභිලාෂයන් සමග ගැටෙන තාක් දුරට පමනකි.

ස්පාඤ්ඤ හා යුරෝපීය ධනේශ්වරයේ ප්‍රතිපත්තිය දෙබිඩි ස්වරූපයක් ගන්නා අතර තමන්ගේ ම හමුදා ශක්තිය තර කර ගැනීම මගින් වොෂින්ටනය සැනසීමට ගන්නා උත්සාහයට සමාන්තරව තමන්ගේ බලගතු තරගකරුවාට විරුද්ධව සිය දෑත් ශක්තිමත් කර ගැනීම ද එකට ඒකාබද්ධ කිරීම මෙම දෙබිඩි ස්වරූපය යි.

ස්පාඤ්ඤ හමුදා මහජනතාවගේ හැඟීම් තෘප්තිමත් කිරීමට සැපටීරෝ ඉරාකයෙන් ස්පාඤ්ඤ හමුදා ඉවත් කර ගත් නමුදු ස්පාඤ්ඤයේ දෙවන විශාලතම හමුදාව යොදවා ඇති ඇෆ්ගනිස්තානයේ දී ද බෝල්කන්හි දී ද ස්පාඤ්ඤය එක්සත් ජනපද හමුදා සමග සහයෝගීව ක්‍රියා කරයි.

ඒ සමගම ඒකාබද්ධ යුරෝපීය හමුදා ශක්තිය ගොඩනැගීම සඳහා සැපටීරෝ ප්‍රන්සය හා ජර්මනිය සමග මිත්‍රත්වය වර්ධනය කිරීමේ ප්‍රතිපත්තියක් ඉදිරියට ගෙනයනු ලබන්නේ ''ලෝක පර්යාය නියෝජනය කිරීම සඳහා ශතවර්ෂයේ වඩාත්ම වැදගත් සහ ඓතිහාසික ව්‍යාපෘතිය වන්නේ ශක්තිමත් යුරෝපයකි'' යන්න අවධාරනය කරමිනි.

එක්සත් ජනපදය සමග පවතින ගැටුම සෘජු සටනක් බවට වේගයෙන් පිරිහී යා හැකි ය. දැන් පවා ටෙහෙරානය සමග ආර්ථික සහ දේශපාලනමය සබඳතා වර්ධනය කිරීමට යුරෝපා බලවතුන් දීර්ගකාලීන උත්සාහයක යෙදී සිටින තත්වය හමුවේ, ඉරානයට විරුද්ධව යම් ආකාරයක හමුදා මැදිහත්වීමක් සඳහා කොන්දේසි නිර්මානය කර ගැනීමට

වොෂින්ටනය කල්යල් බලමින් සිටී. යුරෝපය හා ඉරානය අතර ඉතා දැඩි වානිජ සබඳතා ගොඩ නැගී ඇත. ඉරානය ස්පාඤ්ඤයේ දෙවන විශාලතම තෙල් සැපයුම්කරු වන අතර මැදපෙරදිග ප්‍රදේශයේ ස්පාඤ්ඤයේ නිෂ්පාදිත භාන්ඩ සඳහා හතරවන විශාලතම වෙලඳපොල ද ඉරානය යි. 2004 වර්ෂයේ පලමුවන මාස දහය තුල යුරෝ මිලියන 403ක් වටිනා භාන්ඩ ස්පාඤ්ඤය විසින් ඉරානයට අපනයනය කල අතර එම කාලය තුලදීම යුරෝ මිලියන 942කට වඩා වටිනා ඉරාන නිෂ්පාදන ස්පාඤ්ඤයට ආනයනය කරන ලදි.

## යුරෝපා හවුලේ ස්වරූපය

අනාගතය කුමක් සූදානම් කරන්නේ වුව ද අන්තර් අධිරාජ්‍යවාදී ප්‍රතිරෝධතාවයන්ගේ වර්ධනය විසින් යුරෝපය ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතියේ මූලික වෙනසක් නිර්මානය කොට ඇත.

සීතල යුද්ධ සමයේ සෝවියට් සංගමයට විරුද්ධව ආරක්ෂක පවුරක් සම්පාදනය කරමින් එය යුරෝපය තුල සිය හස්තය ශක්තිමත් කර ගැනීමේ මාධ්‍යයක් ලෙස දුටු වොෂින්ටනයේ ආශිර්වාදය යටතේ පශ්චාත් යුදකාලීන යුරෝපය ඒකාබද්ධ කිරීම ඉදිරියට ඇදී ගියේ ය. එය අංග ලක්ෂනය කරනු ලැබුවේ පන්ති ප්‍රතිරෝධයන් සමහන් කිරීම සඳහා සැකසුනු ආර්ථික හා සමාජ ප්‍රතිපත්තීන් සහ ඒ මගින් මහද්වීපය පුරා දේශපාලන ස්ථාවරත්වය සඳහා කොන්දේසි නිර්මානය කිරීමෙන් ය.

ස්පාඤ්ඤය යුරෝපා හවුලට අවසානයේ දී එක්වූ රටවලින් එකක් වුව ද එය මෙසේ හැඩ ගැසීමෙන් මුලින්ම වාසි ලබාගත් රටක් විය. ඇත්ත වසයෙන් ම යුරෝපා හවුලේ ස්වරූපය සම්බන්ධව ස්පාඤ්ඤ කම්කරුවන් තුල ඉතිරිව ඇති මිථ්‍යාවන් මත විශ්වාසය තබා ඇති යුරෝපීය ධනේශ්වරය ගනන් බලන්නේ යුරෝපා හවුලේ ව්‍යවස්ථාව සඳහා ''ඔව්'' යනුවෙන් ස්පාඤ්ඤයෙන් ලැබෙන ඡන්දය හමුවේ ව්‍යවස්ථාව වෙනත් රටවල් හරහා ද තල්ලු කර ගැනීමට යොදා ගත හැකි බව යි. කම්කරු පන්තිය තමන් මුහුන දී ඇති තර්ජනයේ පරිමාව අවබෝධ කර ගැනීමට නම් එවැනි මිථ්‍යාවන් විරේක කල යුතුව ඇත.

1976 ෆ්‍රැන්කෝ ඒකාධිපතිත්වයේ අවසානයත් සමග යුරෝපය සමග සිය සබඳතා යලි ගොඩ නගා ගැනීමෙන් ද ලතින් ඇමරිකාවේ සහ මධ්‍යධරනී ප්‍රදේශවල තම සාම්ප්‍රදායික බලපෑම් ක්ෂේත්‍රයන් යලි පිහිටුවා ගැනීමෙන් ද ස්පාඤ්ඤ පාලක ප්‍රභූව ස්පාඤ්ඤය ලෝක ආර්ථිකයට නැවත ඒකාබද්ධ කිරීමේ උත්සාහයක යෙදී ගෙන සිටියි. 1982 ෆිලිප් ගොන්සාලේස්ගේ සමාජවාදී පක්ෂයේ ආන්ඩුව තෝරා පත් කර ගැනීමෙන් පසුව ද, 1986 දී ස්පාඤ්ඤය යුරෝපා පොදු වෙලඳ පොලට ඇතුලු වීම ද, 1988 යුරෝපයේ ආරක්ෂක හස්තය වන බටහිර යුරෝපීය සංගමයට ඇතුලු වීමත් සමග ද මෙම ප්‍රතිපත්ති මල් පල ගැන්වින.

යුරෝපා පොදු වෙලඳ හවුලට සම්බන්ධ වීමෙන් ස්පාඤ්ඤ ධනවාදය වාසි ලැබූ අතර යුරෝපීය වෙලඳාම හැසිරවීමටත් පොදු මූල්‍ය ක්‍රමයක් ස්ථිරව පිහිටුවා ගැනීමට හැකිවන පරිදිත් ස්පාඤ්ඤයට නිර්ලෝභීව සහන සපයනු ලැබින. 2002 දී පමනක් යුරෝපා හවුලෙන් ස්පාඤ්ඤයට සපයන ලද සහනාධාරය යුරෝ බිලියන නවයක් එනම් ස්පාඤ්ඤයේ දල දේශීය නිෂ්පානයෙන් සියයට 1.3ක් විය. යුරෝපා හවුල අවශ්‍යයෙන් ම කම්කරුවන්ගේ ජීවිතවලට අර්ථලාභී බලපෑමක් ඇති කරන්නේය යන විශ්වාසයක් මෙ මගින් ඔවුන් තුල දිරිගැන්වී ය.

මේ සිල්ල දැන් වෙනස් වෙමින් පවතී. ජර්මන් සහ ප්‍රන්ස බලපෑම වැලැක්වීම සඳහා ප්‍රධාන වසයෙන් බ්‍රිතාන්‍යය ද පෝලන්තය වැනි නැගෙනහිර රාජ්‍ය ද සහ එක්තරා ප්‍රමානයකට ඉතාලිය සහ පෘතුගාලය ද යොදා ගනිමින් මහාද්වීපය දේශපාලන වසයෙන් බෙදීමේ ද යුරෝපය තුල තම ආධිපත්‍ය තහවුරු කිරීමේ දිසාවට යොමුවුනු එක්සත් ජනපද ප්‍රතිපත්තියේ මූලික වෙනසක් වසයෙන් සෝවියට් සංගමය බිඳ වැටීමෙන් පසුව සනිටුහන් කරයි. මෙය එක්සත් ජනපද ආරක්ෂක ලේකම් ඩොනල්ඩ් රම්ස්ෆෙල්ඩ්ගේ ''නව'' සහ ''පැරනි'' යුරෝපය යන ප්‍රකාශයෙන් සංක්ෂිප්ත කොට දක්වයි.

මෙයට සමගාමීව, ජර්මනිය සහ ප්‍රන්සය මගින් මෙහෙයවනු ලබන යුරෝපා ධනපති පන්තිය ඒකාග්‍රකරනය දකින්නේ, මහාද්වීප පුරා එක්සත් ජනපද ආර්ථික සහ සමාජ කොන්දේසි අනුකරනය කිරීමත් ලෝක පොරපිටිය තුල තම ආනුභාවය ව්‍යාප්ත කිරීමත් සමග බද්ධ වී ඇති පිලිවෙතක් ලෙස ය.

මෙම වෙනස්කම් කලින් ස්ටැලින්වාදී පාලනයට නතුව තිබුනු බොහෝ සෙයින් දුප්පත් රටවල් වන නව සාමාජික රාජ්‍ය 10ක් යුරෝපා සංගමය තුලට ඒකාබද්ධ කර ගැනීම තුල පැහැදිලිව ප්‍රකාශ වී ඇත. නැගෙනහිර දෙසට කෙරුනු ව්‍යාප්තිය, කර්මාන්ත, කෘෂිකර්මාන්තය සහ යටිතල පහසුකම් සඳහා සහනාධාර සැපයීම අවසන් කිරීමේ පිලිවෙත ඉදිරියට තල්ලු කරන හී තුඩක් බවට පත්ව ඇත. 2000 සිට 2006 දක්වා කාලය සඳහා යුරෝපා සංගමයේ ව්‍යුහාත්මක සහ ඒකාබද්ධ අරමුදල්වලින් යුරෝ බිලියන 55ක් කපා හැරීමට නියමිතව ඇත.

යුරෝපා සංගමයේ සහනාධාරවලට සහ අඩු වැටුප්වලට ස්තුති වන්නට ස්පාඤ්ඤය ප්‍රසාදය දිනාගත් ආයෝජන බිමක් බවට පත්ව ඇත. දැන් ස්පාඤ්ඤයේ වැටුප් අනුපාතික මෙන් හතෙන් පංගුවක් තරම් අඩු වැටුප් අනුපාතික ඇති ඒකාබද්ධ ජනගහනය මිලියන

75ක් වන රාජ්‍යයන්ට විරුද්ධව තරග කිරීමට ස්පාඤ්ඤයට සිදුව ඇත.

මෙම වැටුප් කප්පාදුව, ඉහල මට්ටමක සිදුවෙන සූරා කෑම සහ රැකියා අහිමි කිරීම් සඳහා වට්ටෝරුවකි. යුරෝපා සංගමයේ නව ප්‍රවේශකයින්ගේ ජීවන තත්වයන් ඉහල දැමීම වෙනුවට, අලුත්ම සාමාජික රටවල මට්ටමට පමනක් නොව ලතින් ඇමරිකානු, අප්‍රිකානු සහ ආසියානු රටවල මට්ටමට, යුරෝපය පුරාම ජීවන තත්වයන් පහත හෙළීම සඳහා ධනපති පන්තිය උත්සාහයක යෙදෙනු ඇත.

## යුරෝපා සංගමයේ ව්‍යවස්ථාව

මහාද්වීපය පුරාම ආර්ථික හා සමාජ සම්බන්ධතා ඇමරිකානුකරනය සහ යුරෝපීය යුධවාදය වර්ධනය වීම පහසු කිරීමේ ක්‍රියාමාර්ග සහ නිවුන් විධිවිධාන යෝජිත යුරෝපා සංගම් ව්‍යවස්ථාවට අන්තර්ගත කෙරී ඇත.

එය යුරෝපා පුරවැසියන්ගේ අයිතීන් මත පදනම් වූ ව්‍යවස්ථාවක් නො වේ. එය වනාහි, පොදු ආර්ථික මූලෝපායක් වර්ධනය කිරීම සඳහා යුරෝපා සංගමය සහ සාමාජික රටවල් අතර සබඳතා නියාමනය කරන අතර ම වැඩකරන ජනතාවට ඉහලින් ප්‍රාග්ධනයේ සහ පාලක ප්‍රභූවේ අයිතීන් සුරක්ෂිත කොට තැබීමට උත්සාහ කරන ව්‍යවස්ථාවකි. මෙම පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා ව්‍යවස්ථාව ''සේවාවන්, භාන්ඩ සහ ප්‍රාග්ධනය'' සංසරනයවීමේ නිදහස සංග්‍රහකොට ඇති අතර වැඩකරන ජනතාවගේ අයිතීන් පුලුල් ලෙස කප්පාදු කිරීමට හා මහ ව්‍යාපාරිකයන්ගේ අවශ්‍යතාවලට යට කිරීමට නියමිත ය. ''නිදහස, ආරක්ෂාව, සහ යුක්තිය'' යන සංකල්ප ''නිදහස් සහ විකෘති නොකරන ලද තරගයක් සහිත තනි වෙලඳපොලක්'' ආරක්ෂා කිරීමේ ප්‍රතිඥාවට ඈඳා ඇත.

සාමාජික රාජ්‍යයන් පුරාම ආර්ථික, රැකියා නියුක්ති සහ සමාජ පිලිවෙත් සම්බන්ධීකරනය කිරීමේ වගකීම යුරෝපා සංගමය වෙත පවරා ඇත. ව්‍යවස්ථාව ''අභ්‍යන්තර වෙලඳපොල ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය තරග රීති තහවුරු කිරීම'',''ස්වකීය මුදල් ඒකකය ලෙස යුරෝ භාවිතා කරන සාමාජික රටවල් සඳහා මූල්‍ය පිලිවෙත''සහ ''පොදු වානිජ පිලිවෙතක්'' යනාදිය ඇතුලත් හේතු ගනනාවක තනි අධිකාරය ව්‍යවස්ථාව මගින් යුරෝපා සංගමයට පැවරී ඇත.

එක් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ව්‍යවස්ථාව සාමාජික රටවල ස්වාධිපත්‍ය අයිතීන් පැහැදිලිව පිලිගනී: එනම් අභ්‍යන්තර පර්යාය පවත්වා ගෙනයෑම සඳහා පොලිස් සහ මිලිටරි යන්ත්‍රය පාවිච්චි කිරීම. 1-5වන වගන්තියේ 1වන කොටස සඳහන් කරන පරිදි, ව්‍යවස්ථාව, ''රාජ්‍ය භෞමික අඛන්ඩතාව සහතික කිරීම, නීතිය හා සාමය පවත්වා ගැනීම සහ ජාතික ආරක්ෂාව සහතික කිරීම ඇතුලත් ඔවුන්ගේ (සාමාජික රටවල) අත්‍යවශ්‍ය රාජ්‍ය කාර්යයක්ව ගරු කරනු ඇත.''

තමන්ගේ ම අන දීමේ ව්‍යුහයක් සහ විදේශ ඇමතිවරයෙකුගෙන් පරිපූර්න වූ, එක්සත් ජනපදයෙන් සහ නැටෝවෙන් ස්වාධීන වූ බලවේගයක් ලෙස යුරෝපය ස්ථාවරව පිහිටුවීම සඳහා පොදු මිලිටරි ප්‍රතිපත්තියක් සැකසීම ගැන ද ව්‍යවස්ථාවේ සැලකිල්ල යොමු වී ඇත. යෝජිත ව්‍යවස්ථාවේ 1-16 වගන්තිය අවධාරනය කර සිටින්නේ සාමාජික රාජ්‍ය ''ක්‍රියාකාරීව සහ කොන්දේසි විරහිතව සංගමයේ පොදු විදේශ සහ ආරක්ෂක පිලිවෙතට සහයෝගය දෙන'' අතර ''සංගමයේ අවශ්‍යතාවන්ට අයිතීන්ට පටහැනි වන හෝ එහි සඵලත්වයට හානිකර විය හැකි ක්‍රියාවලින් වලකිනු ඇති'' බව යි.

## යුරෝපීය එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා

යුරෝපා සහ ස්පාඤ්ඤ කම්කරු පන්තිය විසින් තම පාලකයන්ගේ සැලසුම් තීරනාත්මක ලෙස ප්‍රතික්ෂේප කිරීම අත්‍යවශ්‍ය කරුනක් බවට පත්වී ඇත. නමුත් මෙම ''නැත'' යන ඡන්දය, එක්සත් වම (ඉස්කිඑර්ඩා උනිඩා-අයියු) විසින් මෙහෙයවනු ලබන ස්පාඤ්ඤයේ විරුද්ධ පක්ෂයේ ව්‍යාපාරයට දේශපාලන සහය දීමක් අදහස් නො කරයි. මෙම ව්‍යවස්ථාව ''යුරෝපා ජනතාවගේ සමාජ සහ යුද විරෝධී ආකල්ප පිලිබිඹු නොකරන'' බවටත් ''මෙය යුරෝපයට උතුරු ඇමරිකාවෙන් වෙනස්වූ තමන්ගේ ම සමාජ ආදර්ශයක් සැලසුම්කර ගැනීම සඳහා උත්කෘෂ්ඨ අවස්ථාවක් විය හැකිව තිබුනු නමුත් මෙම ව්‍යවස්ථාව එම සම්මතයේ අහලකටවත් ලඟා වී නැති'' බවටත් එය''යුරෝපා සමාජ සහ ආර්ථික ආදර්ශය කැලිවලට කඩා දමා ඇති'' බවටත් අයියු නායක ගස්පාර් යමසරෙස් පැමිනිලි කරයි.

කිසියම් යුරෝපා රාජ්‍යයකට හෝ රාජ්‍ය එකතුවකට ධනවාදී පදනම් මත පාදකව, පශ්චාත් යුද කාලීන ආර්ථික සහ සමාජ ආදර්ශය ඉදිරියට ගෙන යෑමේ පදනමක් සැපයිය හැකි ය යන්න මිථ්‍යාවකි. යුරෝපයේ පැවති පුලුල් සහනාධාර සහ සර්ව ජන සුභ සාධන පද්ධතිය පවත්වා ගෙන යාම කල හැකි වූයේ එක්සත් ජනපදය විසින් මෙහෙයවන ලද පශ්චාත් යුද කාලීන උත්පාතය නිසාම පමනකි. භූගෝලීය නිෂ්පාදනයේ වර්ධනය රාජ්‍යවලට එයාකාර ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමට තිබූ හැකියාවට දරුනු ලෙස වල කපා ඇත. පැරනි ශෛලියේ කේන්සියානු ආර්ථික පිලිවෙත්වල සිට නියාමන හරනය සහ පුද්ගලිකරනය මත පදනම්වූ මූලෝපායන් වෙත මාරු වීමේ ගාමක බලවේගය මෙයයි.

තමතමන්ගේ විවිධාකාර බෙදුම්වාදී න්‍යාය පත්‍රයන් ඉදිරියට ගෙනයෑමේ උපක්‍රම ලෙස ''ප්‍රදේශවලින් යුත් යුරෝපයක්'' පිලිබඳ වැඩ පිලිවෙල

ඉදිරිපත් කරන ස්පාඤ්ඤයේ ජාතිකවාදී සහ ප්‍රාදේශීයවාදී පක්ෂවල න්‍යාය පත්‍රයන්ට කිසිම සහනයක් දීමට කම්කරුවන්ට හැකියාවක් නැත. සමාජ සේවාවන් අතුගා දැමීමේ වියදම මතින් ගොඩනගා ගැනෙන සහනශීලී බදු ක්‍රමයක පදනම මත අන්තර්ජාතික සංගත පොලඹවා ගැනීම ද කතලාන් හෝ බස්කෙ කම්කරු පන්තිය ලාභ ශ්‍රමයේ උල්පත් ලෙස පුද දීම ද මගින් තම ප්‍රදේශවලට ආයෝජන ආකර්ශනය කර ගනිමින් සහ මධ්‍යම ආන්ඩුව මගහැර යමින් යුරෝපා ධනේශ්වරයත් සමග ඍජු සබඳතා ගොඩනගා ගැනීමේ මාර්ගයක් ලෙස ද බොහෝ අය ජනමත විචාරනයට සහය දෙති.

ජාතික ස්වාධිපත්‍යය සඳහා හෝ ප්‍රාදේශීය ස්වයංපාලනය සඳහා කරන ඉල්ලීම් බ්‍රසල්ස් වෙතින් එන ආඥාවන්ට විකල්පයක් නො සපයන අතර ඒවායෙන් අදහස් කෙරෙන්නේ, තනි මධ්‍යම සිරගෙයක් වෙනුවට නොයෙක් ආකාර කුඩා සිර මැදිරි ආදේශ කිරීම පමනකි. මහජනතාව ජාතික, වාර්ගික සහ ආගමික රේඛා ඔස්සේ බෙදීම තුඩුදිය හැක්කේ අතිශයින් ම භයංකර ප්‍රතිවිපාක ගෙන දෙමින් මහාද්වීපය බෝල්කනීකරනය වීමට පමනකි.

යුරෝපය සඳහා සැබෑ විකල්පයක් - එනම් වැඩකරන ජනතාවගේ අයිතීන් ආරක්ෂා කරන්නා වූ විකල්පයක් - ධනවාදී ලාභ පද්ධතිය අභියෝගයට ලක් කිරීමෙන් තොරව ක්‍රියාවට දැමිය නොහැකි ය. එය මහාද්වීපය ප්‍රතිවාදී ජාතික රාජ්‍යවලට බෙදීම පරාජය කිරීමේ එකම පදනම ලෙස යුරෝපා එක්සත් සමාජවාදී සමූහාන්ඩුවක් ගොඩනැගීමේ අවශ්‍යතාවය මතු කරයි. මෙය මහ ව්‍යාපාරිකයන්ගේ හා මූල්‍ය ප්‍රභූවේ වෙනුවට කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතේ සමස්ත මහාද්වීපයේ ම නිෂ්පාදන බලවේග වර්ධනය කිරීමට අවකාශ සලසයි.

එක්සත් යුරෝපයක් කම්කරු පන්තියට එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට විරුද්ධව නැගීසිටීම සඳහා ශක්තිමත් පදනමක් සපයනු ඇත. එය ලෝකයේ පීඩිත ජන කොටස් පමනක් නොව පෙන්ටගනයේත්, ධවල මන්දිරයේත් යුදවාදීන්ට විරුද්ධව තමන්ගේම අරගලය ඉදිරියට ගෙන යෑම පිනිස ඇමරිකානු කම්කරු පන්තිය ද උද්යෝගයට පත් කරයි.

මෙම පරමාර්ථය ජය ගනුවස්, ඇමරිකානු ජනතාව බුෂ්ගේ කල්ලියට සමාන කරන බොහෝ සමාජප්‍රජාතනත්‍රවාදීන් සහ ස්ටැලින්වාදීන්ගේ අශික්ෂිත ඇමරිකානු විරෝධතාවාදයට එරෙහිව අධිෂ්ඨාන සහගතව නැගී සිටීම යුරෝපා කම්කරු පන්තිය දේශපාලනිකව යලි හැඩගැස්ම සඳහා අත්‍යවශ්‍ය පිලිවෙතකි.

© www.wsws.org